ජාතික අධ්‍යාපන ආයතනය - 2024

--

1. මූල්‍ය ප්‍රකාශන

1.1 අභිතකර මතය

ජාතික අධ්‍යාපන ආයතනයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ අභිතකර මතය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් ජාතික අධ්‍යාපන ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 අභිතකර මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වල වැදගත් බව හේතුවෙන් අභිතකර මතයක් නිකුත් කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ අභිතකර මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව වස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතන ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01 හි 21(ඉ) ඡේදය අනුව සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශන කට්ටලයක සමන්විත විය යුතු සංරචකයක් ලෙස අස්ථිත්වයක අනුමත කළ අයවැයගත සංඛ්‍යා සහ සත්‍ය සංඛ්‍යා අතර සංසන්දනයක් හෝ මූල්‍ය ප්‍රකාශනවල අයවැයගත සංඛ්‍යා වෙනම තීරුවක් ලෙස ඉදිරිපත් කළ යුතු බව දක්වා තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 21(ඉ) ඡේදය අනුව 2025 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ නිවැරදිව සකස් කරන ලද සත්‍ය සංඛ්‍යා සමඟ අයවැයගත සංඛ්‍යා සංසන්දනය කල හැති ආකාරයට මූල්‍ය ප්‍රකාශන තුළ වෙන වෙනම තීරුවක් ඇතුළත් කර 2025 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව.	මූල්‍ය ප්‍රකාශන කට්ටලයක සමන්විත විය යුතු සංරචකයක් ලෙස අස්ථිත්වයක අනුමත කළ අයවැයගත සංඛ්‍යා සහ සත්‍ය සංඛ්‍යා අතර සංසන්දනයක් හෝ මූල්‍ය ප්‍රකාශනවල අයවැයගත සංඛ්‍යා වෙනම තීරුවක් ලෙස ඉදිරිපත් කළ යුතු බව.
(ආ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03 හි 47 ඡේදය අනුව අස්ථිත්වයක් විසින් ප්‍රමාණාත්මක පූර්ව කාලපරිච්ඡේද වැරදි ඒවා සොයා ගැනීමෙන් පසුව නිකුත් කිරීම සඳහා අනුමත කරන පළමු මූල්‍ය ප්‍රකාශන කට්ටලයෙහි වරද සිදු වූ කාලපරිච්ඡේදය සඳහා ඉදිරිපත් කර ඇති සංසන්දනාත්මක අගයන් නැවත ප්‍රකාශ කිරීමෙන් අතීතයානුයෝගීව නිවැරදි කළ යුතු වුවත්, ඉකුත් වර්ෂයේ දී වැඩියෙන් ගිණුම්ගත කරන ලද	මෙම ගනුදෙනු අතීතානුයෝගීව ගැලපීම් කල යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ සමුච්චිත අරමුදලට ගැලපීම් කිරීම තුළින් ඇති වී ඇති වරද නිවැරදි කර 2025 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව	පෙර වර්ෂවල වැරදි නිවැරදි කිරීමේදී අතීතයානුයෝගීව ගැලපීම් කල මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු බව.

	රු.20,117,007 ක් වූ තොගය, සමාලෝචිත වර්ෂයේදී රු.14,517,150 ක් වූ ගිණුම්ගත නොවුණු නොනිමි තොගය හා ඉකුත් වර්ෂයට අදාල රු.4,572,617 ක් වූ අත්තිකාරම් පියවීම් ද අතීතයානුයෝගීව ගැලපීම් නොකර සමුච්චිත අරමුදලට ගැලපීම් කිරීම හේතුවෙන් සමුච්චිත අරමුදල රු.9,944,533 ක් අඩුවෙන් ගිණුම්ගත වී තිබුණි.		
(ඈ)	ආයතනයේ මුද්‍රණ හා ප්‍රකාශන දෙපාර්තමේන්තුව යටතේ මුද්‍රණ හා අලෙවි ක්‍රියාවලින්ට අදාල නොනිමි තොග ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 9 (ඈ) ඡේදය අනුව ගිණුම්ගත කළ යුතු වුවත් 2024 දෙසැම්බර් 31 දිනට මුද්‍රණයේ පැවති නොනිමි තොගය තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 09 ප්‍රකාරව 2024 දෙසැම්බර් 31 දිනට නොනිමි තොගය තක්සේරු කර ගිණුම්ගත කල යුතු වුවත් එසේ කටයුතු කිරීමට නොහැකි වීමෙන් සිදුවී ඇති වරද නිවැරදි කර 2025 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව.	නොනිමි තොගය හඳුනා ගැනීමට ක්‍රමවේදයක් ස්ථාපිත කර ඒ අනුව ගිණුම්ගත කළ යුතු බව.
(ඇ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 11 ට පටහැනිව සමාලෝචිත වර්ෂය තුළ භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු රු.30,000,000 ක ප්‍රාග්ධන ප්‍රදාන විවිධ ආදායම් යටතේ දක්වා තිබුණි.	භාණ්ඩාගාරයෙන් ලැබුණු රු.30,000,000 ක් වූ ප්‍රාග්ධන ප්‍රදාන අතපසුවීමකින් විවිධ ආදායම් යටතේ ගිණුම්ගත කර ඇත. ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කරමින් සිදුවී ඇති වරද නිවැරදි කර 2025 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව.	ප්‍රාග්ධන ප්‍රදාන යොමුගත ගිණුම්කරණ ප්‍රමිතියේ සඳහන් පරිදි ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම්ගත කිරීම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය තුළ අනාවරණය කළ යුතු බව.
(ඉ)	2024 වර්ෂයේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ අංක 13 ගොඩනැගිල්ලෙහි වහලය රු.794,980 ක වියදමකින් ප්‍රතිස්ථාපනය කර අවසන් කර තිබුණු අතර එය ආයතනය විසින් භාවිතයට ගෙන තිබියදී ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 (14)(ආ) සහ (22) හි විධිවිධාන අනුව ප්‍රාග්ධනිත නොකිරීම හේතුවෙන් රු.794,980 කින් කෙරීගෙන යන වැඩ ගිණුම	නවීකරණය කිරීමට වැය වූ රු. 794,980 ක මුදල අතපසුවීමකින් ප්‍රාග්ධනිත නොකර කෙරීගෙන යන වැඩ ගිණුමෙහි ඇතුළත් වී තිබීම හේතුවෙන් සිදු වී ඇති වරද ඉහත ප්‍රමිතියේ විධිවිධාන අනුව නිවැරදි කර 2025 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව.	කෙරීගෙන යන වැඩවලට අදාල කාර්යය නිමකර භාවිතයට ගත්විට ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කළ යුතු බව.

	වැඩියෙන් හා දේපල පිරියත හා උපකරණ අඩුවෙන් දක්වා තිබුණි.		
(ඊ)	මුද්‍රණ හා ප්‍රකාශන දෙපාර්තමේන්තුව සහ නේවාසිකාගාරය යටතේ පිළිවෙළින් පොත් අලෙවියෙන් හා භෝජනාගාරය, නේවාසිකාගාරය යන කටයුතු තුළින් සමාලෝචිත වර්ෂය තුල පිළිවෙළින් රු.95,969,419 ක් හා රු.53,467,508 ක් වශයෙන් ආදායම් උපයා තිබුණු නමුත් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 17 හි විධිවිධාන අනුව අයභාරය, වියදම හා ලාභය හදුනාගත හැකි පරිදි මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 17හි විධිවිධාන අනුව ඛණ්ඩ සඳහා වෙන වෙනම ඛණ්ඩ ගිණුම් සකස් කර 2025 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව .	මුද්‍රණ හා ප්‍රකාශන දෙපාර්තමේන්තුව සහ නේවාසිකාගාරය සඳහා ඛණ්ඩ ගිණුම් සකස් කර එම එක් එක් ඒකකයේ අයභාරය, වියදම හා ලාභය මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කළ යුතු බව.

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනට ජංගම නොවන පාරිතෝෂික වෙන්කිරීම් ශේෂය රු.102,264,137 ක් සහ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ උපලේඛනය අනුව පාරිතෝෂික වෙන්කිරීම් ශේෂය රු.117,158,659 ක් වූයෙන් රු.14,894,522 ක වෙනසක් නිරීක්ෂණය විය.	නිවැරදි ශේෂය ගිණුම්ගත කර සිදු වී ඇති වරද නිවැරදි කර 2025 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව.	නිවැරදිව වාර්ෂික පාරිතෝෂික ගණනය කර ගිණුම්ගත කළ යුතු බව.
(ආ)	මාස දොළහක් ඇතුළත නිරාකරණය කිරීමට නියමිත සේවක පාරිතෝෂික මුදල රු.17,009,228 ක් විය යුතු වුවත් ජංගම වගකීම් යටතේ එය රු.16,250,362 ක් ලෙස දැක්වීමෙන් රු.758,866 ක් අඩුවෙන් පාරිතෝෂික ගිණුම්ගත කර තිබුණි.	අතපසු වීමකින් සේවකයන් දෙදෙනෙකුට අදාළ පාරිතෝෂික මුදල වන රු.758,866 ක් අඩුවෙන් ගිණුම්ගත වීමෙන් සිදු වී ඇති වරද නිවැරදි කර 2025 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව.	නිවැරදිව වාර්ෂික පාරිතෝෂික ගණනය කර ගිණුම්ගත කළ යුතු බව.

(ඇ)	2024 දෙසැම්බර් 31 දිනට තොග පාලන ලෙජරයෙහි ශේෂය රු.61,690,988 ක් වුවත් මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 04 හි තොග පාලන ගිණුමෙහි ශේෂය රු.26,178,280 ක් වූයෙන් රු.35,512,708 ක වෙනසක් පැවතුණි.	තොග පාලන ගිණුමේත් තොග ගිණුමේත් ශේෂයන්ගේ ඇති වී ඇති විෂමතාවය නිවැරදි කර 2025 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව.	තොගය නිවැරදිව ගිණුම්ගත කිරීම කළ යුතු වීම හා ඒ හේතුවෙන් සිදුවිය හැකි අවභාවිතයන් හා දූෂණයන් වැලැක්වීමට පියවර ගැනීම හා එවැනි තත්ත්වයන් අනාවරණය කර ගැනීමට ක්‍රියාමාර්ග ගතයුතු බව.
(ඉ)	2024 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන ගබඩාවේ තොගය තුල ඇතුලත් රු.1,827,800 ක් වූ ස්ථාවර වත්කම්, වත්කම් ලෙස හඳුනා නොගැනීම හේතුවෙන් දේපළ පිරියත හා උපකරණවල පිරිවැය එම වටිනාකමින් අඩුවෙන්ද අවසන් තොගය එම වටිනාකමින් වැඩියෙන්ද දක්වා තිබුණි.	2024 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන ගබඩාවේ තොගය තුල ඇතුලත් ස්ථාවර වත්කම් පිරිවැය තොගයෙන් ඉවත් කර තොග ගිණුම හා ස්ථාවර වත්කම් යන ගිණුම් නිවැරදි කර 2025 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කරන බව.	ස්ථාවර වත්කම් හා තොගය නිශ්චිතව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු බව හා ඉදිරියේදී එසේ සිදු නොවීමට ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතු බව.
(ඊ)	මහරගම හා මීපේ පරිශ්‍ර තුල වූ මීටර් 1,046 ක අභ්‍යන්තර මාර්ග පද්ධතිය තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර නොතිබුණු අතර රු.9,393,578 ක වියදමින් 2019 වර්ෂයේ දී කාපට් යොදා වැඩිදියුණු කර තිබුණු මහරගම මාර්ග පද්ධතියේ වියදම ප්‍රාග්ධනිත කිරීමකින් තොරව පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.	අභ්‍යන්තර මාර්ග පද්ධතිය තක්සේරු කරවා ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව හා කාපට් කිරීම සඳහා වැය වූ රු.9,393,578 ක මුදල පුනරාවර්තන වියදම් යටතේ ගිණුම්ගත කිරීමෙන් සිදු වී ඇති වරද නිවැරදි කර එම මුදල ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරන බව.	ප්‍රාග්ධන හා මූලධන වියදම් නිශ්චිතව හඳුනාගෙන වියදම හා වත්කම් මූල්‍ය තුළ නිවැරදිව ගිණුම්ගත කළ යුතු බව හා ඒ ඒ වත්කම් පන්ති යටතේ දේපළ පිරියත හා උපකරණ ගිණුම්ගත කළ යුතු බව.
(උ)	සමාලෝචිත වර්ෂයට අදාල ආයෝජන පොළී ආදායම හා ලැබිය යුතු ආයෝජන පොළී ආදායම මූල්‍ය ප්‍රකාශන අනුව පිළිවෙළින් රු.190,751,836 ක් හා රු.345,067,739 ක් වූ අතර විගණනයේ ගණනය කිරීම් අනුව එම අගයන් පිළිවෙළින් රු.155,965,200 ක් හා රු.162,840,212 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ ආයෝජන පොළී ආදායම රු.34,786,636 ක් වැඩියෙන්ද ලැබිය යුතු ආයෝජන පොළී ආදායම රු.182,227,527 ක් වැඩියෙන් ද ගිණුම්ගත කර තිබුණි.	ව්‍යවසාය සම්පත් කළමනාකරණ (ERP) පද්ධතිය තුළ ගිණුම්ගත කිරීමේදී අතපසුවීමකින් වැරදි සංඛ්‍යාවන් සටහන් වීම තුලින් මෙම වරද සිදු වී ඇති බවත් නිවැරදි කර 2025 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව.	සමාලෝචිත වර්ෂයට අදාල ආයෝජන පොළී ආදායම නිවැරදිව ගණනය කර ගිණුම්ගත කළ යුතු බව.

(ඌ)	සමාලෝචිත වර්ෂය තුළදී මහරගම පරිශ්‍රය තුළ වට තාප්පය ඉදිකිරීම හා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් නිල නිවස ප්‍රතිසංස්කරණය කිරීම, මීපේ පරිශ්‍රය තුළ ශාලා අංක 04 වහළය සෙවිලි කිරීම හා අධ්‍යක්ෂ නිල නිවස ප්‍රතිසංස්කරණය කිරීම සඳහා දරන ලද රු.11,759,397 ක් වූ ප්‍රාග්ධන වියදම් පුනරාවර්තන වියදම් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කිරීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් අඩුවෙන් හා පුනරාවර්තන වියදම් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.	ප්‍රමිති ප්‍රකාරව එම වියදම ප්‍රාග්ධනීත කර 2025 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව.	ප්‍රාග්ධන හා මූලධන වියදම් නිශ්චිතව හඳුනාගෙන වියදම හා වත්කම් මූල්‍ය තුළ නිවැරදිව ගිණුම්ගත කළ යුතු බව හා ඒ ඒ වත්කම් පන්ති යටතේ දේපළ පිරියත හා උපකරණ ගිණුම්ගත කළ යුතු බව.
(එ)	ආයතනයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල වූ මෙහෙයුම්, ආයෝජන හා මූල්‍ය ක්‍රියාකාරකම්හි මුදල් ගලාඒම් වල එකතුව පිළිවෙලින් රු.120,378,480 ක්, රු.11,957,386 ක් හා රු.587,452 ක් විය යුතු වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව මුදල් ගලාඒම් වල එකතුව පිළිවෙලින් රු.114,498,331 ක් , (රු.154,561,493) ක් සහ රු.151,629,457 ක් ලෙස දැක්වීම හේතුවෙන් ශුද්ධ මුදල් ප්‍රවාහවල එකතුවෙහි පිළිවෙලින් රු.5,880,149 ක් රු.166,518,879 ක් සහ රු.151,042,005 ක් වශයෙන් වෙනස්කම් පැවතුණි.	වරද නිවැරදි කර මුදල් ප්‍රවාහ ප්‍රකාශය නැවත සකස් කර 2025 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව.	මෙහෙයුම්, ආයෝජන හා මූල්‍ය ක්‍රියාකාරකම්හි මුදල් ගලාඒම් හා ගලායාම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව නිවැරදිව හඳුනාගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව නිවැරදිව පිළියෙළ කළ යුතු බව.
(ඒ)	ආයතනය විසින් මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙළ කිරීමේදී මුදල් හා මුදල් සමාන දෑ වල වර්ෂ අවසාන ශේෂයට ශුද්ධ මුදල් ප්‍රවාහයේ එකතුව සමාන වී නොතිබුණු බැවින් වෙනත් ගැලපීම් ලෙස රු.59,126,107 ක ශේෂයක් මෙමෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලාඒම් ලෙස සඳහන් කර මුදල් ප්‍රවාහ ප්‍රකාශය සාවද්‍ය ලෙස පිළියෙළ කර තිබුණි.	වරද නිවැරදි කර මුදල් ප්‍රවාහ ප්‍රකාශය නැවත සකස් කර 2025 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව.	මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ මෙහෙයුම්, ආයෝජන හා මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ එකතුවල ශේෂ සමාන නොවූ විට ඒවා අනාවරණය කර ගැනීමට කටයුතු නොකර ව්‍යාජ අගයන් ඇතුළත් කර මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙළ කිරීමට කටයුතු නොකළ යුතු බව.

(ඔ)	සමාලෝචිත වර්ෂයේදී ප්‍රධාන ගබඩාවේ තොග සමීක්ෂණ වාර්තාව අනුව තොගය රු.24,752,952 ක් වුවත් තොග පාලන ගිණුමේ ශේෂය රු.26,178,280 ක් වීමෙන් රු.1,425,328 ක වෙනසක් නිරීක්ෂණය විය.	සිදු වී ඇති වරද නිවැරදි කර 2025 වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව.	තොගය නිවැරදිව ගිණුම්ගත කිරීම කළ යුතු වීම හා ඒ හේතුවෙන් සිදුවිය හැකි අවභාවිතයන් හා දූෂණයන් වැලැක්වීමට පියවර ගැනීම හා එවැනි තත්ත්වයන් අනාවරණය කර ගැනීමට ක්‍රියාමාර්ග ගතයුතු බව.

1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

විෂයය	මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම	අනුරූපී වාර්තා අනුව වටිනාකම	වෙනස	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
	රු.	රු.	රු.		
ස්ථාවර වත්කම්	7,283,591,465	6,749,451,001	534,140,464	නැවත ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය සිදුකර නිවැරදි ස්ථාවර වත්කම් ලේඛනය ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව.	ස්ථාවර වත්කම් ලේඛනය නිවැරදිව වගවීමෙන් යුතුව පිළියෙළ කිරීමට කටයුතු කළයුතු බව.

1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

	විෂයය	මුදල	නොසැපයූ විගණන සාක්ෂි	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
		රු.			
(අ)	ප්‍රාග්ධන ප්‍රධාන	(1,118,285,578)	සෘණ ශේෂය තහවුරු කිරීමට අදාල ලේඛන	රු.1,118,285,578 ක සෘණ ශේෂය පිළිබඳව සාක්ෂි සොයා බලා 2025 දෙසැම්බර් 15 දිනට පෙර විගණන අධිකාරී වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව.	මෙම සෘණ ශේෂය ඇති වීමට හේතු වූ කරුණු හා සෘණ ශේෂය තහවුරු කිරීමට අදාල තොරතුරු නිවැරදිව විගණනයට ඉදිරිපත් කළ යුතු බව.

(ආ)	ණය අරමුදල	70,336,385	දීර්ඝකාලීන ව ක්‍රියාකාරී නොවන ණය අරමුදලක් වූ අතර එය තහවුරු කිරීමට අදාල සාක්ෂි	රු.70,336,385 ක ආපදා ණය අරමුදල් ශේෂය තහවුරු කර ගැනීම සඳහා ලිඛිත සාක්ෂි සොයා බලා 2025 දෙසැම්බර් 15 දිනට පෙර විගණන අධිකාරී වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව.	දීර්ඝකාලීනව ක්‍රියාකාරී නොවන ණය අරමුදල ස්ථාපිත කිරීමේ අරමුණ හා එම ශේෂය තහවුරු කිරීමට අදාල තොරතුරු නිවැරදිව විගණනයට ඉදිරිපත් කළ යුතු බව.
(ඇ)	JICA Building Complex ශේෂය	660,000,000	ප්‍රාග්ධන ප්‍රදාන තුළ ඇතුලත් රු JICA Building Complex ශේෂය තහවුරු කිරීමට අදාල සාක්ෂි	මෙම ප්‍රාග්ධන ප්‍රදාන ශේෂ සම්න්ධයෙන් සාක්ෂි සොයා බලා 2025 දෙසැම්බර් 15 දිනට පෙර විගණන අධිකාරී වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව.	ප්‍රාග්ධන ප්‍රදාන ලැබීමේ අරමුණු හා එම ප්‍රාග්ධන ප්‍රදාන ශේෂය තහවුරු කිරීමට අදාල තොරතුරු නිවැරදිව විගණනයට ඉදිරිපත් කළ යුතු බව.
(ඈ)	ප්‍රදාන ශේෂ 7 ක එකතුව	489,456,037	වසර 20 කට වඩා වැඩි කාලයක සිට නොවෙනස් ව පැවතුණ ප්‍රාග්ධන ප්‍රදාන ශේෂ 7 ක එකතුව තහවුරු කිරීමට අදාල සාක්ෂි	මෙම ප්‍රාග්ධන ප්‍රදාන ශේෂ සම්බන්ධයෙන් සාක්ෂි සොයා බලා 2025 දෙසැම්බර් 15 දිනට පෙර විගණන අධිකාරී වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව .	ප්‍රාග්ධන ප්‍රදාන ශේෂ 7 ලැබීමේ අරමුණු හා එම දීර්ඝකාලීන ප්‍රාග්ධන ප්‍රදාන ශේෂය තහවුරු කිරීමට අදාල තොරතුරු නිවැරදිව විගණනයට ඉදිරිපත් කළ යුතු බව.
(ඉ)	APCEIU– Fund	3,393,579	සටහන් අංක 14 හි ඇතුළත් APCEIU– Fund තහවුරු	මෙම අරමුදලට අදාල සාක්ෂි සොයා බලා 2025 දෙසැම්බර් 15 දිනට පෙර විගණන අධිකාරී	APCEIU– Fund ඇති කිරීමේ අරමුණු හා එම ශේෂය තහවුරු කිරීමට අදාල තොරතුරු විගණනයට ඉදිරිපත්

			කිරීමට අදාල සාක්ෂි	වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව.	කළ යුතු බව.
(ඊ)	පර්යේෂණ සංවර්ධනය සඳහා වෙන්කිරීම් සංචිතය	3,535,000	පර්යේෂණ සංවර්ධනය සඳහා වෙන්කිරීම් සංචිතය තහවුරු කිරීමට අදාල සාක්ෂි	මෙම පර්යේෂණ හා සංවර්ධන වෙන්කිරීමේ සංචිතයට අදාල සාක්ෂි සොයා බලා 2025 දෙසැම්බර් 15 දිනට පෙර විගණන අධිකාරී වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව.	පර්යේෂණ සංවර්ධනය සඳහා වෙන්කිරීම් සංචිතය ඇති කිරීමේ අරමුණු හා ශේෂය තහවුරු කිරීමට අදාල තොරතුරු විගණනයට ඉදිරිපත් කළ යුතු බව.

1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 2021/01 රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයේ 05 වන පරිච්ඡේදයේ ඇමුණුම 01	ආයතනය වෙනුවෙන් සෑම වර්ෂයක් සඳහාම අනුමත අයවැය ඇස්තමේන්තු ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතු අතර, ඉදිරි වර්ෂය සඳහා වන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 15 දිනට පෙර සකස් කර රේඛීය අමාත්‍යාංශය හරහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වුවද ,ඒ අනුව කටයුතු කර නොතිබුණි.	ප්‍රවර්ථන වර්ෂයේ දෙසැම්බර් 15 දිනට පෙර භාර දී නොමැති බවට හේතු වී ඇත්තේ රජයෙන් ලැබෙන ප්‍රතිපාදන හා විෂයමාලාව සංවර්ධනයට ලැබෙන ප්‍රතිපාදන පිළිබඳ කාලය හා අවිනිශ්චිත ස්වභාවය නිසා බව.	ආයතනයේ දැක්ම මෙහෙවර, අරමුණු හා කාර්යයන් අනුව සැකසූ වාර්ෂික ප්‍රමුඛතා අනුව සකස් කළ කෙටුම්පත් ක්‍රියාකාරී සැලැස්ම ඒ ඒ වර්ෂයේ අයවැය යෝජනා දීමේදී සකස් කර තිබිය යුතු වන අතර, අයවැය අනුමත වූ පසුව ලැබෙන ප්‍රතිපාදන අනුව කෙටුම්පත් ක්‍රියාකාරී සැලැස්ම ප්‍රමුඛතා අනුව සංශෝධනය කිරීමට සිදුවන බැවින් ඒ අනුව කටයුතු කර වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම කාලීනව පිළියෙළ කර ගැනීමේ ක්‍රමවේදයක්

				ස්ථාපිත කළ යුතු බව.
(ආ)	2017 ඔක්තෝබර් 25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 2017/05	විධායක ශ්‍රේණියේ නිලධාරීන් ඔවුන් එම තනතුරට පත්වූ දිනයේ සිට සක්‍රීය සේවා කාලය පදනම් කරගෙන ගෙවනු ලබන වෘත්තීය දීමනාව එපරිදි ගණනය කිරීමකින් තොරව එම නිලධාරියා පළමු පත්වීම් දිනයේ සිට සේවා කාලය පදනම් කර ගනිමින් වෘත්තීය දීමනාව ගෙවීමට කටයුතු කර තිබුණි. නියැදි පරීක්ෂාව අනුව ආයතනයේ නිලධාරින් 58 දෙනෙකු සඳහා 2024-2017 කාලසීමාව තුළ රු.17,207,201 ක් වැඩිපුර ගෙවීමට කටයුතු කර තිබුණි .මීට අදාලව වගකීමට යටත් වන නිලධාරීන් සම්බන්ධයෙන් ඉදිරි පියවර ගැනීම සහ සමස්ථ පරීක්ෂාවක් සිදුකර වැඩිපුර ගෙවන ලද මුදල් හදුනාගෙන අය කිරීමට කටයුතු කර නොතිබුණි.	පරිපාලන හා මානව සම්පත් දෙපාර්තමේන්තුව මගින් වෘත්තීය දීමනාව ගෙවීමට අදාළ සමස්ත පරීක්ෂාවක් සිදු කිරීම, මේ වන විට ආරම්භ කර ඇති අතර එය කඩිනමින් අවසන් කර වැඩිපුර ගෙවන ලද මුදල පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව.	චක්‍රලේඛවලට අනුකූලව ගෙවීම් කළ යුතු බව හා එසේ නොවුණු විට ගණන්දීමේ නිලධාරී හා ප්‍රධාන මූල්‍ය නිලධාරී ඒ සම්බන්ධව පවත්නා පාලන ක්‍රම නිවැරදිව ස්ථාපිත නොකිරීම සම්බන්ධව වගකීමට යටත් වන බැවින් නිශ්චිත පාලන ක්‍රම ස්ථාපිත කළ යුතු වීම හා වැඩිපුර ගෙවීම් සම්බන්ධව ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතු බව.
(ඇ)	1994 අප්‍රේල් 20 දිනැති අංක 94/30 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය	විදේශාධාර සම්බන්ධ සියලුම ගනුදෙනු මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව එකඟතාවය මත සිදුකල යුතු නමුත් කොරියානු රජය විසින් 2014 වර්ෂයේ සිට 2024 දක්වා කාලසීමාව තුල වාර්ෂිකව බ්‍රිජ් සේජෝන් ශ්‍රී ලංකා (Bridge Sejong Sri Lanka) ව්‍යාපෘතියෙන් රු. 69,439,274 ක මුදලක් ජාතික අධ්‍යාපන ආයතනය විසින් විදේශ	2026 අයවැය සකස් කිරීමේදී වාර්ෂික අයවැයෙහි ඇතුළත් වන විදේශ ප්‍රදාන පිළිබඳව විදේශ සම්පත් දෙපාර්තමේන්තුව දැනුවත් කිරීමට හා එකඟතාවය ලබා ගැනීමට කටයුතු කරන බව.	රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අනුව භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව එකඟතාවය ලබාගෙන නිසි පරිදි කාලීනව ගිණුම්ගත කිරීමට කටයුතු කිරීම තුළින් විදේශ ප්‍රදාන ලබා ගැනීම භාණ්ඩාගාරයේ ගිණුම්වලට ඇතුළත් කිරීමේ යාන්ත්‍රණය ක්‍රියාත්මක කළ යුතු බව.

		සම්පත් දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් හා එකඟතාවයකින් තොරව ලබාගැනීමට කටයුතු කර තිබුණි.		
(ඇ)	ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ 2004/පුස්/01 (2016 සංශෝධිත) දරන චක්‍රලේඛය	වාර්ෂිකව පුස්තකාල පොත් සංගණනයක් සිදු කළ යුතු වුවද 2019 වර්ෂයෙන් පසු සංගණනයක් සිදුකර නොතිබුණි.	2025 වසර අවසානයේ පොත් පිළිබඳ සංගණනයක් සිදු කිරීමට නියමිත බව.	ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ චක්‍රලේඛ අනුව වාර්ෂිකව පුස්තකාල පොත් සංගණනයක් සිදුකළ යුතු බව.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.314,337,733 අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 150,995,694 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 465,333,427 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පාඨමාලා ආදායම හා නේවාසිකාගාර ආදායම වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

පාඨමාලා ආදායම් හඳුනාගැනීම මුදල් පදනමේ සිට උපචිත පදනම වෙත සමාලෝචිත වර්ෂයේදී මාරුවීම සිදුවී තිබුණු අතර, 2024 වර්ෂයේදී පෙර වසරට සාපේක්ෂව පාඨමාලා ආදායම සියයට 366 කින් වැඩි වීමට හේතු වී තිබුණි. එසේම නේවාසිකාගාර ආදායම සියයට 174 කින් ද වැඩි වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 අනාර්ථික ගනුදෙනු

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2021 හා 2022 වර්ෂවලදී නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීමට රු.15,412,150 ක වියදමින් රූපවාහිනී වැඩසටහන් 05 ක් සැලසිනේ ආයතනය හා එක්ව සකස් කර තිබුණු බව සඳහන් නමුත් එම වැඩසටහන් ප්‍රචාරය කර නොතිබුණි.	2022 හා 2023 වර්ෂවල විෂයමාලා ප්‍රතිසංස්කරණ කටයුතු ක්‍රියාත්මක නොවීම නිසා වැඩසටහන් ප්‍රචාරය කර නොමැති බව.	2021 හා 2022 වර්ෂවලදී සකස් කරන ලද විකාශනය නොවූ රූපවාහිණී වැඩසටහන් වල අන්තර්ගතය යල් පැනීම සිදු වී ඇති බැවින් එසේ විකාශනය නොකරන ලද නිලධාරීන් සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතු බව.

3.2 හඳුනාගත් පාඩු

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
12 ශ්‍රේණිය ජීව විද්‍යාව (ඉංග්‍රීසි මාධ්‍යය) සම්පත් පොතෙහි අන්තර්ගත විෂය කරුණු 34 ක දෝෂ සහගත කරුණු ඇතුලත්ව පැවතීම හේතුවෙන් බාහිර පාර්ශවයක් විසින් 2019 වර්ෂයේදී පවරන ලද නඩු කටයුත්ත 2022 වර්ෂයේදී ඉල්ලා අස්කරගෙන තිබුණු අතර 2020 වර්ෂයේදී මෙම සම්පත් පොත යල් පැනගිය තත්ත්වයට පත් වී තිබුණු අතර, ආයතනයට රු.813,624 ක අලාභයක් වී තිබුණි.	පොත සංශෝධන සහිතව නැවත මුද්‍රණය කර අලෙවිය සඳහා යොදා ගත් අතර විකිණීම අත්හිටවූ පසු ඉතිරි වූ පොත් 1,218 සම්බන්ධයෙන් ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳ විමසීමක් ඊළඟ ආයතන සභාව වෙත ඉදිරිපත් කිරීමට නියමිත බව.	මෙම දෝෂ වැලැක්වීමට අවශ්‍ය කටයුතු සිදු කල යුතු බව හා සිදු වූ අලාභය පියවා ගැනීමට කටයුතු කල යුතු බව.

3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ජාතික අධ්‍යාපන ආයතනයේ මහරගම පරිශ්‍රය තුල ලංකා බැංකුව මගින් බැංකු කාර්යාලයක් හා ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයක් පවත්වාගෙන යනු ලබන නමුත්, එම ආයතනය සමඟ කුලී ගිවිසුමක් අත්සන් කර නොතිබුණු අතර, එම ආයතනය වෙතින් කුලී මුදලක්ද අය කරගෙන නොතිබුණි. මේ පිළිබඳව ඉකුත් වර්ෂයේ විගණන වාර්තා මගින් නිරීක්ෂණය කර තිබුණු නමුත් 2025 දෙසැම්බර් 31 දින වන විටත් ඒ සඳහා ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	ලංකා බැංකු ශාඛාව වෙනුවෙන් කුලී අයකර ගැනීම සඳහා 2025 ජනවාරි 06 හා 2025 මැයි 27 දිනයන්හිදී ලිපි යොමු කර ඇති බව.	ආයතනයේ වත්කම් බාහිර පාර්ශවයන් පරිහරණයේදී නීත්‍යානුකූල ගිවිසුම් වලට එළඹිය යුතු අතර කුලී මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු බව.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	උසස් පෙළ විෂයධාරාවල ප්‍රධාන විෂයයන් අනුව විෂයමාලා රාමුව සකස් කිරීමක් සිදුකර තිබුණු නමුත්, එයට සමගාමීව උසස් පෙළ විෂයයන් සඳහා පෙළපොත් සැකසීමට මැදිහත්වීමක් සිදුනොකර ජාතික අධ්‍යාපන ආයතනය විසින්, විද්‍යා/ගණිත විෂයධාරා යටතේ විෂයයන් සඳහා පමණක් සම්පත් පොත් සකසා අලෙවි කිරීමක් සිදු කරමින් තිබුණි.	පිළිතුරු ලබා දී නොමැත.	පරිබාහිර අරමුණු වලින් තොරව ආයතනික පනත ප්‍රකාරව ආයතනයට පැවරුණු කාර්යයන් මනාව කාලීනව ඉටුකර අධ්‍යාපන අංශයේ ගුණාත්මක සංවර්ධනය ළඟාකර ගැනීමට කටයුතු කළ යුතු බව හා උසස් පෙළට සම්පත් පොත් නොව පෙළපොත් මුද්‍රණය කර සිසුන්ට

			ලබාදීම සම්බන්ධයෙන් ප්‍රමුඛතාවය ලබා දී කටයුතු කළයුතු බව.
(ආ)	2020-2024 කාලසීමාව තුල රු.483,332,938 ක් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් හා විදේශ ණය ව්‍යාපෘති මගින් ජාතික අධ්‍යාපන ආයතනයට නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණයන්හි ක්‍රියාකාරකම් වෙනුවෙන් ලබා දී තිබුණු බව ආයතනයෙන් ලබාදුන් තොරතුරුවල සඳහන් නමුත් නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සඳහා ප්‍රතිපාදන ලැබෙන මූලාශ්‍ර අනුව ප්‍රධාන වැය විෂයය සංකේතය යටතේ උප වැය විෂයයන් හඳුනාගෙන ඒ අනුව එම නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල එක් එක් ක්‍රියාකාරකම්හි වියදම් වාර්තා කලහැකි පරිදි වියදම් ගිණුම්ගත කිරිමට කටයුතු කර නොතිබුණි. ආයතනයේ සාමාන්‍ය ක්‍රියාකාරකම් යටතට අයත් ක්‍රියාකාරකම්වල වියදම් ගිණුම්ගත කරන ලෙජර් ගිණුම් තුලම නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වියදම්ද ගිණුම්ගතකර තිබුණි. ඒ අනුව ජාතික අධ්‍යාපන ආයතනයට නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණයන් වෙනුවෙන් 2020 වර්ෂයේ සිට 2024 කාලසීමාව තුළ ලබා දී තිබුණු රු.483,332,938 ක් වූ මුදල හා ඊට අදාලව දරන ලද වියදම හඳුනාගත හැකි පරිදි ගිණුම් තැබීමට හා වාර්තා පවත්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. ඒ හේතුවෙන් නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාකාරකම්වල මූල්‍ය ප්‍රගතියට සමගාමීව භෞතික ප්‍රගතියද ඒ අනුව නියමිත කාලරාමුව අනුව කාර්යසාධනයද පරීක්ෂා කිරීමට නොහැකි වී තිබුණි.	අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සඳහා ද්විතියික අධ්‍යාපන ආංශික සංවර්ධන ව්‍යාපෘතිය (SESIP) හා සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය (GEMP) යන ව්‍යාපෘතීන් යටතේ ඉහත කී ප්‍රතිපාදන ලැබී ඇති අතර එම ප්‍රතිපාදන භාවිතා කර කරන ලද වියදම් ERP පද්ධතිය තුළ නිර්මාණය කර ඇති අයවැය වාර්තා මගින් හඳුනා ගැනීමට හැකි බව.	නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සඳහා ප්‍රතිපාදන ලැබෙන මූලාශ්‍ර අනුව ප්‍රධාන වැය විෂයය සංකේතය යටතේ උප වැය විෂයයන් හඳුනාගෙන ඒ අනුව නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල එක් එක් ක්‍රියාකාරකම්හි වියදම හඳුනාගත හැකි පරිදි ගිණුම් තැබීමට හා වාර්තා පවත්වා ගැනීමට කටයුතු කර මූල්‍ය ප්‍රගතියට සාපේක්ෂව භෞතික ප්‍රගතියද නියමිත කාලරාමුවට අදාල කාර්යසාධනය ද සමාලෝචනය කළ යුතු බව හා ඒ අනුව කටයුතු කරමින් නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ මොඩියුලවල විෂයමාලා රාමුව හා විෂයමාලා සංවර්ධනය ගුණාත්මක ප්‍රමිතිගත තත්ත්වයන් යටතේ සිදුවන බවට තහවුරු කරමින් ඊට අදාල අනෙකුත් ක්‍රියකාරකම් ද එපරිදි සැලසුම්ගතව ප්‍රගතිය හා ගුණාත්මකබව තහවුරු කරමින් සමාලෝචනය කර ගිණුම් වාර්ථා සකස් කිරීමට කටයුතු කළ යුතු බව.
(ඇ)	2026 වර්ෂයේදී නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වූ නව වැඩපිළිවෙලට අදාල මාර්ග සිතියම (Road Map) 2025 මාර්තු 26 දින වන විට ජාතික අධ්‍යාපන ආයතනය විසින් සකස් කිරීමේ කටයුතු, අවසන් අදියරේ	අදාළ මාර්ග සිතියම සකස් කර අධ්‍යාපන ඇමතිතුමියගේ ප්‍රධානත්වයෙන් පැවති රැස්වීම් කිහිපයකදීම සාකච්ඡා කරන ලද නමුත් අවසන් එකඟතාවයකට පැමිණීමට නොහැකි වූ	යෝජිත නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙලට අදාල කෙටිකාලීන, මධ්‍යකාලීන හා දීර්ඝකාලීන වශයෙන් වූ කාලරාමුව අනුව අධ්‍යාපන අමාත්‍යාංශය, අධ්‍යාපන

පවතින බව අමාත්‍යාංශයේ විගණන කමිටු රැස්වීමේදී ආයතනයේ කළමණාකාරිත්වය දැනුම් දී තිබුණි. ඒ අනුව 2026 ජනවාරි මාසයේදී 1 හා 6 ශ්‍රේණිවලට පළමුව හඳුන්වාදී, ඉදිරි වර්ෂවලදී ක්‍රමානුකූලව ක්‍රියාත්මක කිරීමට යෝජිත නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙලට අදාල කෙටිකාලීන, මධ්‍යකාලීන හා දීර්ඝකාලීන වශයෙන් වූ කාලරාමුව අනුව අධ්‍යාපන අමාත්‍යාංශය, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව, ජාතික අධ්‍යාපන ආයතනය යනාදී ආයතනවලට අදාල කාර්යයභාරය, ක්‍රියාකාරකම්, ඒවායේ ප්‍රමිතිගත බව, වගකීම, ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ඇතුළත් අධ්‍යාපන අමාත්‍යාංශයේ මධ්‍යගත අධීක්ෂණ වැඩපිළිවෙළක් සහිතව පිළියෙල කළයුතු මාර්ග සිතියම අවසන් කිරීමට 2025 සැප්තැම්බර් 30 දින වන විටත් ජාතික අධ්‍යාපන ආයතනය අපොහොසත් වී තිබුණි. ඒ අනුව පනත ප්‍රකාරව ආයතනයට පැවරුණු කාර්යයන් සැලසුම් කර අමාත්‍යාංශයට උපදෙස් ලබාදීමේ පරමාර්ථය ඉටු කිරීමෙන් බැහැර වී තිබුණි.

(ඇ) 2022 පෙබරවාරි 09 දිනැති අංක ED/RF/11/02/03 දරන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විශ්ව විද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ ලිපියේ සඳහන් පරිදි ජාතික අධ්‍යාපන ආයතනය සහ රාජ්‍ය අමාත්‍යාංශය එක්ව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ එකඟතාවයෙන් නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් හඳුනාගන්නා ලද නව විෂයමාලා රාමුව 2020 නොවැම්බර් 10 වන දින වන විට නිශ්චිතව හඳුනාගත් පසු 2022 වර්ෂයේදී නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ විෂයමාලා සංවර්ධනය කිරීමේ වගකීම ජාතික අධ්‍යාපන ආයතනයට පවරා දී තිබුණු අතර, පරීක්ෂා කරන බවත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමා විසින් විකල්ප දෙකක් යෝජනා කරන ලද අතර එය ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයට ඉදිරිපත් කරන ලදී. එහිදී ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය විසින් දෙවන විකල්පය වඩාත් සුදුසු මාර්ග සිතියම වශයෙන් තෝරා ගන්නා ලෙසට දැනුම් දුන් අතර ඒ බව අධ්‍යක්ෂ ජනරාල් විසින් 2025.05.09 දිනැතිව ලිපියක් මඟින් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත දන්වා ඇති බව.

ප්‍රකාශන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව, ජාතික අධ්‍යාපන ආයතනය යනාදී ආයතනවලට අදාල කාර්යයභාරය, ක්‍රියාකාරකම්, ඒවායේ ප්‍රමිතිගත බව, වගකීම, ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ඇතුළත්, අධ්‍යාපන අමාත්‍යාංශයේ මධ්‍යගත අධීක්ෂණ වැඩපිළිවෙළක් සහිතව පිළියෙල කළයුතු මාර්ග සිතියම (Road Map) සකස් කර පනත ප්‍රකාරව ආයතනයට පැවරුණු කාර්යයන් ඉටු කළ යුතු බව.

	ලද 2025 ජූනි 06 හා සැප්තැම්බර් 25 යන දින වන විටත් එකී කර්තව්‍ය ආයතනය විසින් සිදුකරමින් පැවතුණු අතර, ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.		
(i)	නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් දැනට භාවිතා වන පෙළපොත් වෙනුවට 1 - 11 ශ්‍රේණි සඳහා මොඩියුල යටතේ විෂයමාලා සංවර්ධනය කිරීමේ වගකීම ජාතික අධ්‍යාපන ආයතනයට 2022 පෙබරවාරි මාසයේ සිට පවරා තිබුණු නමුත්, එක් එක් විෂයයන් යටතේ මොඩියුල, මූලික සංවර්ධන අදියරේ සිට අවසන් සංවර්ධන අදියර දක්වා වැඩපිළිවෙළට අදාල සමස්ථ සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.	නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් ඒ ඒ කාල වකවානුවලදී අධ්‍යාපන අමාත්‍යාංශය, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය, ජනාධිපති ලේකම් කාර්යාලය වරින්වර ලබා දුන් නියෝග අනුව විෂයමාලා ද්‍රව්‍යවලට අදාළව 1,2,6,8,10,11 ශ්‍රේණි සඳහා කෙටුම්පත් සකස් කර තිබුණු බව.	නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල විෂය සංවර්ධනය කිරීම යටතේ ඊට අදාලව සුදුසුකම්ලත් කමිටු මට්ටම් කිහිපයකින් පත්කිරීම මූලිකව විෂය සංවර්ධන කළයුතු අධ්‍යාපන ප්‍රතිපත්තිය හා අධ්‍යාපන අංශයේ තාක්ෂණික ප්‍රතිපත්තිය හඳුනාගැනීම යනාදී වශයෙන් ක්‍රියාකාරකම් යටතේ සමස්ථ සැලැස්මක් පිළියෙල කළ යුතු වීම හා මධ්‍යගත ස්ථාපිත මධ්‍යස්ථානයක් හරහා සමස්ථ සැලැස්මට ඇතුලත් ක්‍රියාකාරකම් වලින් ඒ ඒ වර්ෂවලදී ඉටුකරනු ලබන ක්‍රියාකාරකම් ආයතනයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර එහි ක්‍රියාකාරකම් යටතේ කාර්යයන් හා වගකිම, ඒ ඒ අංශ , දෙපාර්තමේන්තු වල නිලධාරීන් වෙත පැවරීමද එම කාර්යය එම නිලධාරීන් විසින් නිම කළ පසුව භාරගැනීම අනුමත කිරීම නියමිත කාලසීමාවන් තුළදී වගකිවයුතු ආකාරයෙන් නිසි ප්‍රමිතියකින් යුතුව ඉටුකර ගැනීමට අදාල මධ්‍යගත යාන්ත්‍රණයක් ස්ථාපිත කර 1-11 විෂයය සංවර්ධන කටයුතු සිදු කළ යුතු බව.
(ii)	මොඩියුල සකස් කිරීමේ සමස්ථ සැලැස්මෙන් එක් එක් වර්ෂයේදී ඉටුකර ගත යුතු මොඩියුල හා ඊට	නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් ඒ ඒ කාල	-එම-

	අදාල උප කාර්යයන් ජාතික අධ්‍යාපන ආයතනයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම තුලට ඇතුලත් කරමින් පිරිවැය, කාලය හා වගකීම නිශ්චිතව හඳුනාගත හැකි පරිදි සැලැස්මක් සහිතව මොඩියුල සකස් කිරීමට ජාතික අධ්‍යාපන ආයතනය කටයුතු කර නොතිබුණි.	වකවානුවලදී අධ්‍යාපන අමාත්‍යාංශය, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ රාජ්‍ය අමාත්‍යාංශය, ජනාධිපති ලේකම් කාර්යාලය වරින්වර ලබා දුන් නියෝග අනුව විෂයමාලා ද්‍රව්‍යවලට අදාළව 1,2,6,8,10,11 ශ්‍රේණි සඳහා කෙටුම්පත් සකස් කර තිබුණු බව.	
(iii)	විෂයමාලා රාමුව සැකසීම හා විෂයමාලා සංවර්ධනය කිරීමට 2020-2024 කාලසීමාව තුළ රු.483,332,938 ක් ආයතනය විසින් ඉදිරිපත් කල තොරතුරු අනුව වැයකර තිබුණු නමුත්, 1 සිට 11 ශ්‍රේණිවල මොඩියුල සංවර්ධනය කිරීම ජාතික අධ්‍යාපන ආයතනයේ එක් ස්ථානයක් හරහා මෙහෙයවීම හා අධීක්ෂණය යටතේ සිදුකර නොතිබුණු අතර 2025 සැප්තැම්බර් 30 දින වන විට සකස් කරන ලද එක් එක් ශ්‍රේණි යටතේ වාර අනුව මොඩියුල පිළිබඳ තොරතුරු (1 හා 6 හැර) විගණනයට ඉදිරිපත් නොකෙරුණු අතර අධ්‍යාපන අමාත්‍යාංශයටද ඒ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි.	විෂයමාලා ප්‍රතිසංස්කරණය ක්‍රියාත්මක වන්නේ ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලදුව ජාතික අධ්‍යාපන ආයතනය හා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් එකග වන ලද ක්‍රියාත්මක කිරීමේ ජාතික වැඩසටහනට අනුවය. ඒ අනුව 2026 වර්ෂයේ පළමු වාරයට අදාලව 1,6 ශ්‍රේණි සඳහා හඳුන්වාදීමට බලාපොරොත්තු වන විෂයමාලා ද්‍රව්‍ය පිළිබඳව තොරතුරු අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය නිශ්චිත කාලරාමුවට අනුව සිදු කරමින් පවතින බව.	-එම-
(iv)	1 හා 6 ශ්‍රේණිවල පළමු වාරය සඳහා නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ හඳුන්වාදීමට නියමිත පොත් සංඛ්‍යාව 106 ක් ලෙස විගණනයට ඉදිරිපත් කර තිබුණද ඊට අදාල මොඩියුල සංඛ්‍යාව ඉදිරිපත් නොකෙරුණි. 1 හා 6 ශ්‍රේණි වල දෙවන හා තෙවන වාරයේ මොඩියුල සංඛ්‍යාව ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් ලබාදුන් තොරතුරු හා දෙපාර්තමේන්තු මගින් ලබාගත් තොරතුරු අනුව පිළිවෙලින් 31 ක් හා 46 ක් වශයෙන් වෙනස්කම් පැවතුණි. ඒ අනුව සකස් කරන සියලු මොඩියුල එක් ප්‍රධාන ස්ථානයකින්	අදාළ මොඩියුල වල වගකීම දරණ නිලධාරීන් විසින් සියලු කටයුතු කරන බැවින් මගහැරීමට ඇති ඉඩකඩ සීමිත බව හා මොඩියුල පිළිබඳ තොරතුරු දෙපාර්තමේන්තු වලින් අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය වෙත වාර්තාවීමේදී ඇතිවූ ප්‍රමාදයක් හේතුවෙන් මෙම දෝෂය සිදුවී ඇති බව. .	-එම-

	මෙහෙයවීම හා අධීක්ෂණ නොවීම තුල ඒ ඒ විෂයය යටතේ පිළියෙල කළ යුතු ලෙස හඳුනාගන්නා ලද මොඩියුල අත්හැරීමේ අවධානමක් නිරීක්ෂණය විය. ජාතික අධ්‍යාපන ආයතනය විසින් විෂයරාමුව හා විෂය සංවර්ධනය කරන ලද මොඩියුල සියල්ල 2025 ජනවාරි මාසයේදී අධ්‍යාපන අමාත්‍යාංශයේ විෂය අධ්‍යක්ෂකවරු යටතේ විෂයරාමුව හා විෂය සංවර්ධනය සම්බන්ධයෙන් සමාලෝචනය කර ඒවායේ විෂයය අන්තර්ගතය පිළිබඳ නිර්දේශ ජාතික අධ්‍යාපන ආයතනයට භාරදී තිබුණු නමුත් සමාලෝචනය යටතේ එම සියලු අඩුපාඩු හඳුනාගනිමින්, හඳුනාගත් අඩුපාඩු නැවත සකස් කල බව තහවුරු කරගත හැකි පරිදි ආයතනය විසින් තොරතුරු පවත්වාගෙන ගොස් නොතිබුණි. ඒ අනුව නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ 2026 වන විට 1 හා 6 ශ්‍රේණි සඳහා හඳුන්වාදීමට සකස් කරන ලද මොඩියුලවල විෂයරාමුව හා විෂය සංවර්ධනය අන්තර්ගතය නියමිත අයුරින්ම සිදුකර තිබේද යන්න විගණනය තහවුරු කරගත නොහැකි විය.		
(v)	පොතක් සංවර්ධනය කිරීමේදී ආරම්භයේ සිටම indesign ක්‍රමයට පිළියෙල කළ යුතු වුවත්, ආයතනය විසින් විෂයමාලා සංවර්ධනය කිරීමේදී මොඩියුල සැකසීම එපරිදි සිදු නොකිරීම හේතුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ මැදිහත්වීමෙන් 1 හා 6 ශ්‍රේණිවල පළමු වාරයේ මොඩියුල සඳහා තාක්ෂණික සහාය අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවෙන් ලබාගැනීමට 2025 මැයි වන විටත් කටයුතු කරමින් තිබුණි.	විශේෂඥ දැනුම ඇති අය යොදාගෙන එම කාර්ය මේ වන විට අවසන් කරමින් පවතින බව.	-එම-

(vi)	2025 මැයි 06 දිනැති අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අංක ED/17/03/01/01/01 දරන ලිපිය පරිදි 1 හා 6 ශ්‍රේණිවල පළමු වාරයේ මොඩියුල සහිත පොත් 2025 මැයි 15 දින වන විට අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට ලබාදිය යුතුව තිබුණද මාස 04 ක ප්‍රමාදයකින් යුතුව 2025 ජූලි 01 දින සිට 2025 සැප්තැම්බර් 16 දින දක්වා අවස්ථා 10 ක් තුල පොත් 106 ට අදාල දෘඩ පිටපත් දෙකක් හා මෘදු පිටපතක් බැගින් ලබාදීමට කටයුතු කර තිබුණි.	නිලධාරීන්ගේ හිඟය, අදාළ සම්පත් ලබගැනීමේ අපහසුව සහ අවස්ථා කිහිපයකදී සංශෝධන එකතු කිරීම ආදී කරුණු නිසා ලිපියේ සඳහන් දිනට අදාළ පොත් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව වෙත භාර දීමට නොහැකි වූ බව.	-එම-
(vii)	2025 අගෝස්තු 27 දිනැති අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්ගේ අංක EPD/Pro/1/1/11/2024 දරන ලිපියෙහි සඳහන් පරිදි 2025 ජූලි 21 දින වන විට මොඩියුල සහිත පොත් 50 ක් පමණක් භාරදී තිබුණද 2025 ජූලි 21 දිනැති අධ්‍යක්ෂ ජනරාල්ගේ වාර්තාව අනුව 1 හා 6 ශ්‍රේණිවල පළමු වාරයට අදාල මොඩියුල 106 ක් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව වෙත භාරදුන් බවට නිවැරදි නොවූ තොරතුරු විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි.	අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉදිරිපත් කර ඇති වාර්තාවේ ප්‍රමාද දෝෂයක් සිදු වී ඇති බව.	-එම-
(viii)	1 හා 6 ශ්‍රේණිවල දෙවන හා තුන්වන වාර සඳහා මොඩියුල 151 සකස් කර තිබෙන බව ආයතනය විසින් විගණනයට ඉදිරිපත් කර තිබුණු නමුත් ඒ සඳහා වන තාක්ෂණික සහාය ලබාගැනීම, අක්ෂරවල නිවැරදිතාවය පරීක්ෂා කිරීම සහ අනුමැතිය ලබාගැනීම හා ISBN අංක ලබාගැනීම යන කාර්යයන් සිදුකර නොතිබුණු අතර, දෙවන හා තුන්වන වාර සඳහා මොඩියුල සහිත පොත්වල පිරිවිතර අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව වෙත 2025 සැප්තැම්බර් 30 දින වන විටත් ලබා දී නොතිබුණි.	2025 සැප්තැම්බර් 30 දින වන විට පිරිවිතර ලබා දීම සම්පූර්ණ කිරීමට නොහැකි වූයේ පළමු වාරයට අදාළ පොත් මුද්‍රණයට භාර දීමට ප්‍රමුඛතාවය ලබාදීම නිසා වන අතර ඒ පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශය සහ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව ද දැනුවත් කර ඇති බව.	-එම-

(ඉ)	ආයතනයේ අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීමට අදාලව අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් කළ යුතු කාර්යයන් හඳුනාගත හැකි වන පරිදි රාජකාරි පැවරීමක් ආරම්භයේ සිටම සිදුකර නොතිබුණු අතර ආයතනයේ අරමුණු හා පරමාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා අධ්‍යයන කාර්යමණ්ඩලය විසින් සිදුකරන ක්‍රියාකාරකම්වල කාර්යසාධනය මැනීම සඳහා නිර්ණායක ඇතුලත් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන්ගේ සිට සියලුම අධ්‍යයන කාර්ය මණ්ඩල නිලධාරීන් කළ යුතු කාර්යයන් පිළිබඳ තොරතුරු වාර්ෂික ක්‍රියාකාරකම් සැලැස්මේ සඳහන්ව ඇත. ඒ ඒ ව්‍යාපෘති සඳහා අංකයක් ලබා දී ඇති අතර එම අංකයට අදාල ව්‍යාපෘතිය අධීක්ෂණය කරන නිලධාරියා හා අදාළ කණ්ඩායම පැහැදිලිව සඳහන් කර ඇත. එමෙන්ම එක් එක් ව්‍යාපෘතියට අදාළ ක්‍රියාකාරකම්වල වගකිව යුතු නිලධාරීන් වාර්ෂික සැලැස්මේ දක්වා ඇති අතර එම වාර්ෂික සැලැස්ම ආයතන සභාව විසින් අනුමත කර ඇති බව හා සෑම කාර්තුවක් අවසානයේදීම එක් එක් දෙපාර්තමේන්තුවල අදාළ මූල්‍ය හා භෞතික ප්‍රගතිය සාක්ෂි සහිතව සැලසුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතු අතර එය ආයතන සභාවට ඉදිරිපත් කරන බව.	ක්‍රියාකාරී සැලැස්ම පදනම් කරගෙන නිලධාරීන්ගේ කාර්යසාධනය මැනීම සිදු කළ නොහැකි අතර රාජකාරී ස්වභාවයට අදාල රාජකාරි පැවරුම් අනුව(Duty List) එක් එක් නිලධාරියා තනි තනිව ඇගයීමට අදාලව සකස් කළ නිර්ණායක මත පදනම්ව එය සිදුවිය යුතුය. එබැවින් කාර්යමණ්ඩලය විසින් එම කාර්යයන්වල ස්වභාවය අනුව සිදුකරන ක්‍රියාකාරකම්වල කාර්යසාධනය මැනීම සඳහා නිර්ණායක ඇතුලත් ක්‍රමවේදයක් සකස් කර ඒවා කාලීනව සමාලෝචනය සිදුකළ යුතු බව.

3.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2017-2024 කාලසීමාව තුල අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කර තිබුණු අතර භාණ්ඩාගාර අනුමැතියක් ලබාගැනීමකින් තොරව රක්ෂණ ක්‍රමය සඳහා වූ දායකත්ව මුදලින් කොටසක් රජයේ අරමුදල්වලින් දැරීමට කටයුතු කර තිබුණි. එලෙස 2023 හා 2024 වර්ෂවලදී දායකත්ව මුදල්	අග්‍රහාර රක්ෂණ ක්‍රමය ජාතික අධ්‍යාපන ආයතනය තුල ක්‍රියාත්මක කිරීම සඳහා ආයතන සභාවේ අනුමැතිය ලබාගෙන ඇති බවත් ඒ සඳහා ආයතනයේ උපයන ලද ආදායම් මුදලින් ගෙවීම් කරනු ලබන අතර මේ සඳහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන ලබාගැනීම	ආයතනයේ කාර්ය මණ්ඩලයට වැටුප් හා වේතන භාණ්ඩාගාරයෙන් ගෙවීම් සහ රජයේ භෞතික සම්පත් භාවිතා කරමින් රජයේ සංස්ථාවක් ලෙස ස්ථාපිතවීම හේතුවෙන් ආයතනයේ ආදායමද රජයේ අරමුදල් වන බැවින් භාණ්ඩාගාර

රු.2,620,800 ක් රජයේ අරමුදලින් ගෙවා තිබුණි.	සිදුනොකරන බව.	අනුමැතියකින් යුතුව වියදම් කල යුතු බව.
(ආ) මූලික වැටුපෙන් සියයට 50 ඉක්මවා 2020 – 2024 කාලසීමාවේදී නිලධාරීන් 35 දෙනෙකුට ගෙවා තිබුණු සම්පත්දායක දීමනා මුදල, 2024 දෙසැම්බර් 31 වන විටත් රු.5,718,318 ක් වූ අතර ඉන් 2024 වර්ෂය තුලදී නිලධාරීන් දෙදෙනෙකුගෙන් රු 400,028.ක් පමණක් අයකර තිබුණු අතර 2024 දෙසැම්බර් 31 දිනට රු.5,318,290 ක ශේෂයක් තව දුරටත් අයවිය යුතුව පැවතුණි.	විගණන කමිටුව සමඟ ඉදිරියේදී සාකච්ඡා කර මෙම අගයන් නැවත අයකර ගැනීම සම්බන්ධයෙන් සුදුසු තීරණයකට එළඹීමට නියමිත බව.	වැඩිපුර ගෙවීම් අයකර ගැනීම ප්‍රමාණවත් පරිදි සිදුකර නොමැති බැවින් ගණන්දීමේ නිලධාරී විසින් ඒ සම්බන්ධයෙන් ක්‍රියාකර රජයට සිදුවූ පාඩුව අය කර ගැනීමට ක්‍රියාකළ යුතු බව.

3.6 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ජාතික අධ්‍යාපන ආයතනයට අයත් මීපේ ගුරු පුහුණු මධ්‍යස්ථානයට අයත් පරිශ්‍රය තුල රු.2,993,200 ක් වටිනා ගොඩනැගිලි 05 ක් ප්‍රයෝජනයට ගැනීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි.	අලුත්වැඩියා කර ඉදිරියේදී භාවිතයට ගැනීමට කටයුතු සූදානම් කරමින් පවතින බව.	නිෂ්කාර්යව පැවතුණ වත්කම් ආයතනයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා භාවිතා කිරීමට කටයුතු කළයුතු බව.

3.7 වෙනත් සංවිධානවලට මුදාහළ සම්පත්

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් පිරිවැය රු.90,354,435 ක ස්ථාවර වත්කම් පවරාදීම සම්බන්ධයෙන් නීත්‍යානුකූල එකඟතාවයන්ට එළඹ නොතිබියදී ඇපයෙන් සීමිත සමාගමක් ලෙස ස්ථාපිත දකුණු ආසියානු ගුරු පුහුණු මධ්‍යස්ථානයේ පරිහරණයට එම වත්කම් ලබා දී තිබුණි.	මෙම ආයතනය සම්බන්ධයෙන් ඉහත කැබිනට් තීරණය හා අධ්‍යාපන ලේකම්ගේ ලිපිය අනුව අදාළ වත්කම් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා 2025 ජනවාරි 30 දිනැති 492 වැනි ආයතන සභාවට කරුණු ඉදිරිපත් කරන ලද අතර ඒ අනුව කටයුතු කිරීම සඳහා එම මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් දන්වා ඇත. ඒ අනුව වත්කම් පරිහරණය සම්බන්ධයෙන් තීරණයක් නීමට නියමිත බව.	රජයේ වත්කම් වෙනත් බාහිර පාර්ශවයකගේ පරිහරණයට නීත්‍යානුකූල පදනමකින් තොරව ලබාදීම සිදු නොකළ යුතු බව.

3.8 වාහන පද්ධතිය කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් රු.2,800,000 ක ප්‍රත්‍යාගණන වටිනාකමක් සහිත මෝටර් රථ 2 ක් ධාවන තත්ත්වයේ නොපවතින බව නිරීක්ෂණය වූ අතර, ආයතනයේ පවතින වාහන 29 කට අනුයුක්ත රියදුරන් සංඛ්‍යාව 14 ක් වූයෙන් වාහන ඌන උපයෝජිතව භාවිතා කරමින් පැවතුණි.	රියදුරන් බඳවාගැනීමට කටයුතු සිදුකරන බව හා පවතින ඌන උපයෝජනය වැළැක්වීම සඳහා සෑම රියදුරෙකුටම අයත් නිත්‍ය වාහනයට අමතරව ධාවන මට්ටමෙන් පවත්වා ගෙන යාම සඳහා අමතර වාහනයක් ලබා දීමට කටයුතු කර ඇති බව.	වාහන මනා කළමනාකරණයකින් යුතුව උපරිම කාර්යක්ෂමතාවයකින් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු බව.

4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2021 නොවැම්බර් 16 දිනැති අංක 2021/01 දරන රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ මෙහෙයුම් අත්පොතෙහි 6.6ඡේදය අනුව මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් තුළ එම වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන දින 20ක ප්‍රමාදයකින් යුතුව විගණනය වෙත ඉදිරිපත් කෙරුණු අතර 2025 ජුනි 13 දිනැතිව කෙටුම්පත් විගණන වාර්තාව නිකුත් කළද 2025 ජුනි 19 දිනැති අංක NIE/DDG/AF/Finance/2025/14 දරන ලිපියෙන් මූල්‍ය ප්‍රකාශන ඉල්ලා අස්කර ගැනීමෙන් පසුව 2025 ජූලි 16 දින නැවත විගණනයට ඉදිරිපත් කෙරුණි .	2025 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන නිසි ආකාරයට සකස් කර 2026 පෙබරවාරි 28 දිනට පෙර ජාතික විගණන කාර්යාලය වෙත භාර දීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව.	චක්‍රලේඛවලට හා ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කරනු ලබන මූල්‍ය ප්‍රකාශන ඒ ඒ වර්ෂයේ පෙබරවාරි 28 දිනට පෙර විගණනයට ඉදිරිපත් කළයුතු බව.

4.2 වාර්ෂික වාර්තාව

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 17 වගන්තිය අනුව 2022 හා 2023 වර්ෂවල වාර්ෂික වාර්තා 2025 අගෝස්තු 20 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.	2022/2023 වාර්ෂික වාර්තාවලට අදාළ කැබිනට් පත්‍රිකාව ගරු අධ්‍යාපන අමාත්‍යතුමියගේ අත්සනට අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යවා තිබුණු අතර 2025 ජුනි 18 දින නැවතත් සංශෝධනය කරමින් අප වෙත එවූ අතර එම සංශෝධනයන් සිදු කර 2025 ජුනි 20 දින අධ්‍යාපන අමාත්‍යාංශයට භාර දෙන ලද බව.	චක්‍රලේඛ අනුව කටයුතු කරමින් වාර්ෂික වාර්තා නියමිත පරිදි පාර්ලිමේන්තුවේ සභාගත කල යුතු බව.

4.3 කළමනාකරණ තොරතුරු පද්ධතියේ ඵලදායීත්වය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ජාතික අධ්‍යාපන ආයතනයේ අරමුණු, පරමාර්ථ හා කාර්යයන් ඉටුකර ගැනීම සම්බන්ධයෙන් එක් එක් ක්ෂේත්‍රවලට අදාලවන ක්‍රියාකාරකම් හි ප්‍රතිඵල දැක්වෙන කළමනාකරණ තොරතුරු පද්ධතියක් යාවත්කාලීනව පවත්වා ගැනීමට සමාලෝචිත වර්ෂය වන විටත් ආයතනය කටයුතු කර නොතිබුණි.	දැනට ව්‍යවසාය සම්පත් කළමනාකරණ පද්ධතිය (ERP) ආයතනය තුළ ස්ථාපිත කර ඇති බවත්, එහි මොඩියුල 02 වර්තමානය වන විට ක්‍රියාත්මක බවත්, ඉතිරි මොඩියුල සංවර්ධනය කර ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති බව.	කළමණාකරණ තීරණ ගතහැකි නිසි කළමණාකරණ තොරතුරු පද්ධතියක් සියලු මොඩියුල සහිතව යාවත්කාලීනව පවත්වා ගැනීමට කටයුතු කළ යුතු බව.

4.4 අභ්‍යන්තර විගණනය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය සහ මුදල් රෙගුලාසි 133 (1) අනුව අභ්‍යන්තර විගණක විසින් ආයතනයේ මුදල් කටයුතු පිළිබඳව පවතින අභ්‍යන්තර පාලන ක්‍රමයට සහභාගී වී එම කටයුතුවල වැරදි හා වංචා වැලැක්වීමට සහ අනාවරණය කර ගැනීමට භාවිතා කරනු ලබන අභ්යන්තර සෝදිසියෙහි විධිමත් බව හා ප්‍රමාණවත් බව පිළිබඳ අඛණ්ඩ සමීක්ෂණයක් හා ස්වාධීන ඇගයුමක් පවත්වාගෙන යාම සිදුකල යුතු බව	තනතුරු 03 ක් පුරප්පාඩුව පැවතුණ ද මෙම නිලධාරීන් දෙදෙනා විසින් 2024 වර්ෂය තුළදී පැවති මානව සම්පත උපයෝගී කරගෙන උපරිම දායකත්වය ලබාදෙමින් විගණන රාජකාරී කටයුතු ඉටු කර ඇති බව.	ආයතනයේ සියලු ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි සකස් කරන ලද කෙටුම්පත් අභ්‍යන්තර විගණන සැලැස්ම රජයේ විගණන අංශයේ එකඟතාවය ලබා ගනිමින් ඒ සඳහා අදාල අනුමැතිය ලබාගෙන, කාලීනව අභ්‍යන්තර විගණන සැලැස්ම අනුව කටයුතු කර කාර්යයභාරයන් මනාව ඉටුකරන පරිදි

දක්වා තිබුණද, වැරදි හා වංචා වැලැක්වීමට සහ අනාවරණය කර ගැනීමට, අභ්‍යන්තර පාලන ක්‍රම පරීක්ෂා කිරීමට සහ නව අභ්‍යන්තර පාලන ක්‍රම හඳුන්වාදීමට ආයතනයේ අභ්‍යන්තර විගණන අංශය ප්‍රමාණවත් කාර්යභාරයක් සිදුකර නොමැති බව අභ්‍යන්තර විගණන සැලසුම් හා වාර්තා අනුව නිරීක්ෂණය විය.

මෙහෙයවීමට ගණන්දීමේ නිලධාරී කටයුතු කලයුතු බව.